**ලන්දේසි පාලන සමයේ ඉදිවූ කොළඹ කොටුවේ වුල්ෆන්ඩොල් දේවස්ථානය පිළිබඳ විමර්ශනයක්**

එස්.ඒ. දිල්හානි S.A. Dilhani[1]

17 වන සියවස ආරම්භයත් සමඟ පෙරදිග මුහුදු කලාපයේ මෙතෙක් පෘතුගීසින් දැරූ ස්ථානය ලන්දේසින් අතට පත්විය. 1602 දී ඕලන්ද සියලු වෙළඳ සමාගම් එකතු වී ඕලන්ද පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම පිහිටුවා ගනිමින් පෙරදිග ප්‍රදේශවල වෙළද බලය හා බලකොටු පිහිටුවීය. 1638 දී මුල්වරට ලන්දේසින් ලංකාවේ පාලකයා සමග ගිවිසුමක් ඇති කරගැනීමෙන් පසුව මෙරට දේශපාලනයට සම්බන්ධ විය.

1638 - 1658 අතර කාලයේ ලන්දේසින් පහත රට ප්‍රදේශවල සිය ආගමික කටයුතු ආරම්භ කළ නමුත් ඔවුන්ට පෘතුගීසි ආගමික ආධිපත්‍යයට විරුද්ධව සටන් කිරීමට සිදුවිය. මන්ද, ලන්දේසීන්ගේ ආගම වූයේ රෙපරමාදු කතෝලික ආගමයි. මෙහි විශේෂත්වය නම් රෙපරමාදු දේවස්ථාන තුළ කන්‍යා මරිතුමියගේ හා ශාන්තුවරයින්ගේ චිත්‍ර, මූර්ති කැටයම් දක්නට නොලැබෙන අතර චාම් බවින් යුක්තවීමයි.

ලන්දේසීහු පෘතුගීසි දේවස්ථාන තම ආගමික අභිලාෂයට ගැලපෙන පරිදි වෙනස් කර ගැනීමට සමත් විය. මාතර, ගාල්ල, කල්පිටිය, යාපනය යන ලන්දේසී බල ප්‍රදේශවල රෙපරමාදු දේවස්ථාන දැකිය හැකි අතර ලන්දේසි පාලන සමයේ ප්‍රධාන දේවස්ථානය වූයේ කොළඹ කොටුවේ පිහිටි වුල්ෆන්ඩෝල් රෙපරමාදු දේවස්ථානයයි. 1749 දී ලන්දේසීන්ගේ විශාලම දේවස්ථානය මෙය වන අතර කලින් පෘතුගීසි පල්ලියකි. පසුව ලන්දේසීන් තමන්ගේ ආගමික පරිසරයට අනුකූල වන පරිදි වෙනස් කර ගත්හ. දේවස්ථානය ඉදි කිරීමට අනුග්‍රහය දක්වා තිබෙන්නේ ජුලියස් වැලන්ටයින් ස්ටෙයින් ෆන් ගෙලනීස් නම් ආණ්ඩුකාරු විසිනි. මුලින් ම මෙම දේවස්ථානය භාවිතා කොට ඇත්තේ තම ආගම වෙනස් කරමින් කතෝලික ආගම වැළඳ ගත් ලංකිකයන්ට වුවත් පසුව ලන්දේසි පෙරදිග වෙළඳ සමාගමේ දේවස්ථානයක් බවට පත් විය.

කුරුසයක හැඩයක් ගන්නා මෙම දේවස්ථානය චාම් බවින් යුක්ත අතර අලංකාරබවක් එක් කර ඇත්තේ 17 හා 18 වන සියවස්වල යුරෝපයේ ප්‍රචලිත වූ බැරෝක් (Barroque) සහ රෙකෝකෝ (Rococo) ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලිනි.

මූලාශ්‍රය පරිශිලනය හා දත්ත එක්රැස් කිරීම මගින් සහ අදාළ ක්ෂේත්‍රය ගවේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ. මෙහිදී වුල්ෆන්ඩෝල් දේවස්ථාන ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක අංග සහ එහි සුවිශේෂිත්වය පිළිබඳ අවධානය යොමු කරමින් ලන්දේසි පාලන සමයේ ඉදිවූ කොළඹ කොටුවේ වුල්ෆන්ඩොල් දේවස්ථානයේ ඓතිහාසික වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂනයේ අරමුණ වේ.

මුඛ්‍ය පද - ලන්දේසින්, රෙපරමාදු දේවස්ථානය, ගෘහ නිර්මාණ ශිල්පය

[1]. ආධුනික කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
anuruddhika.dilhani@yahoo.com